# *10th Cub Holiday Camp*
# *Colombo District*
### *Opening Ceremony and Closing Ceremony - Songs*

---

## පෝතක බාලදක්ෂ ගීතය

මුළු ලොවම අපේ - මව්බිමත් අපේ
අපි වෙමු එහි නායකයෝ
මල් සුවඳ දීදී ගුණරුවින් සැදී
අපි වෙමු හොඳ පෝතකයෝ ...

සැම විරිය කරමි - ඉටු කරන රිසින්
යුතුකම් රට දැයට අපේ
රැළ එකතු වෙමින් පියනගමු තුටින්
බී පී නම රැඳුනු මගේ

මුළු උලුහුම් එමදේ
තායි නාඩුම් එමදේ
ආහිඩුවෝම් අදන් තලෛවර්හල්
මලර් වාසුමුඩන්
නට්ගුණංගලුඩන්
ආහිඩුවෝම් ඉලම් සාරණර්හල්

අද පෝතකයෝ හෙට නායකයෝ
සුදු පියුම් විලස පිපෙනා
වෙමු දායකයෝ රට ගොඩ නගනා
සමගිය බලයයි වටිනා.....

| | | |
|---|---|---|
| ගීත රචනය | - කේ.ඒ චන්ද්‍රපත්මා | - සහය දීසා කොමසාරිස් හෝමාගම |
| සංගීතය | - කුමරි නිලුශිකා වෙත්තසිංහ | - පෝතක බාලදක්ෂ නායිකා හෝමාගම |

## පෝතක බාලදක්ෂ නිවාඩු දින ගීතය

අපගේ දිසාවේ අප සැම
තරු අහුරක් සේ එක පොකුරට
එක් වී කඳවුරු බැඳගෙන සැම දෙන
යමු අපි එක් වී යහපත් ලොවකට //

වැඩක් කළත් එය හරියට කරලා
රටක් දැයක් ගැන නිතරම හිතලා //
උනන්දුවෙන් යුතුකම් ඉටු කරලා
හොඳින් හැදෙමු අපි හෙට ගැන හිතලා

නටා ගයා නිති විනෝද වන්නට
ආකේලා හට කීකරු වන්නට
මිතුරු දමින් අපි එකට බැඳෙන්නට
සාමය සමගිය ලොව පතුරන්නට